**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මෙම විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල **දැනට ස්ථිර සේවයේ නියුතු, තනතුරෙහි තහවුරු කරන ලද සේවක භවතුන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.**

සියළුම අයදුම්කරුවන් කොළඹ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙහි (cmb.ac.lk) පළකරන ලද ගූගල් පෝරම් සබැඳිය (Google form link) ඔස්සේ අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. **(ඒ සඳහා මේ සමග අමුණා ඇති උපදෙස් පත්‍රිකාව අනුගමනය කරන්න.)** එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඩ පිටපත (Hard Copy) සහතික කරන ලද සහතිකවල පිටපත් සමග තමා සේවය කරන ආයතනයේ ලේකම්/මණ්ඩපාධිපති/ ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ මගින් **2025.10.31** දින හෝ එදිනට පෙර **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අනධ්‍යයන ආයතන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, නො.94, කුමාරතුංග මුණිදාස මාවත, කොළඹ 03** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මාර්ගගත ක්‍රමය යටතේ (Online) අයදුම්පත් යොමු කිරීම සහ එහි දෘඪ පිටපත සහතික කරන ලද සහතිකවල පිටපත් සමග යොමු කිරීම අනිවාර්යය වන අතර එසේ නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පහත දැක්වෙන ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර එම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණා එවනු නොලබන අයදුම්පත්, අසම්පූර්ණ, අතින් සකසන ලද හෝ ආදර්ශ අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එසේ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

### 1. පූර්ණකාලීන උපශාලාධිපති II ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබිය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳව පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

| | |
|---|---|
| **වැටුප් පරිමාණය** | : UMN 3 (II) - රු.71,365-18 x 1,190-92,785 (මාසික) |
| **බඳවා ගනු ලබන ආකාරය** | : ලිඛිත පරීක්ෂණය සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**02. කළමනාකරණ සහකාර (පොත් තැබීම්) III ශ්‍රේණිය**

**සුදුසුකම් :**

01. අ.පො.ස. (සා/පෙළ) විභාගයේ

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත් වී තිබීම.

**සහ**

02. අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**සටහන**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

අ). පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්

**සහ**

ආ). පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**තනතුරට විශේෂිත සුදුසුකම්**

අ) නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය/ තාක්ෂණික විද්‍යාල මගින් ලබාදෙන ගණක ශිල්පීන් සඳහා ජාතික සහතිකය සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

**හෝ**

ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය වාණිජ විෂය ධාරාවෙන් හදාරා තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය** : රු. 49,475 - 17 x 540 - 58,655 මාසික - U MN 1 (III )
**බඳවා ගනු ලබන ආකාරය** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**03. කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය**

**සුදුසුකම් :**

01. අ.පො.ස. (සා/පෙළ) විභාගයේ

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත් වී තිබීම.

**සහ**

02. අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**සටහන**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

අ). පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්

**සහ**

ආ). පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**තනතුරට විශේෂිත සුදුසුකම්**

අ). අ.පො.ස. (උ/පෙළ) විභාගයෙහි **ගිණුම්කරණය** විෂය සමත්වී තිබිය යුතුය.

**සටහන** : විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන ආරක්ෂිත තැන්පතුවක් (මුදල් මගින්) ලබා දිය යුතුය.

**වැටුප් ක්‍රමය** : රු. 49,475 - 17 x 540 - 58,655 මාසික - U MN 1 (III )

**බඳවා ගනු ලබන ආකාරය** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සැලකිය යුතුයි:**

මෙම තනතුරුවලට බඳවා ගැනීමේ දී වැටුප් පිහිටවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනය සඳහා වන ආයතන සංග්‍රහය -2023 හි VI වන පරිච්ඡේදයේ 6.5 හා 26 උප වගන්තිය අනුව වේ.

**ලේඛකාධිකාරී**
කොළඹ විශ්වවිද්‍යාලය
2025.10.10